0 0210

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීතිවේදී උපාධි පාඨමාලාව - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2022/2023**

පොදු අන්තර්ජාතික නීතිය - LLU5712/LWU3315

කාලය- පැය 3

---

දිනය : 23.03.2024 වේලාව:පෙ.ව 09.30 – ප.ව. 12.30

---

**ප්‍රශ්න පහක් (05) සඳහා පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. 2001 සැප්තැම්බර් 11 වන දා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩී.සී හි සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයට පසුව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සිය 4370 වන රැස්වීමේ දී 1368 දරන යෝජනා සම්මතය සම්මත කරමින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අන්තර්ගත මූලධර්ම සහ අරමුණු යළි අවධාරණය කළේය. ත්‍රස්තවාදී ප්‍රහාර නිසා අන්තර්ජාතික සාමය හා ආරක්ෂාවට සිදුවන තර්ජනයට එරෙහිව සටන් කිරීමට ඉන් අධිෂ්ඨානය පළ කෙරුණු අතර, ප්‍රඥප්තියට අනුකූලව, තනිව හෝ සාමූහිකව ආත්මාරක්ෂාව සපයා ගැනීමට යම් රටකට තිබෙන නෛසර්ගික අයිතිය පිලිගනු ලැබීය.

   'එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව තනි හෝ සාමූහික ආත්මාරක්ෂාව සපයා ගැනීමට රටවල් සඳහා තිබෙන නෛසර්ගික අයිතිවාසිකම' යන මාතෘකාව යටතේ විශ්ලේෂණයක් ලිවීමට නීති ශිෂ්‍යයෙක් ලෙස ඔබට පැවැරී තිබේ යැයි උපකල්පනය කරන්න. අන්තර්ජාතික නීතිය තුල පවතින සමකාලීන වර්ධනයන් හා අදාළ නඩු නීතිය ආශ්‍රයෙන් ඔබගේ විශ්ලේෂණය සනාථ කළ යුතුය.

   **(ලකුණු 20)**

2. අදාල නඩු නීතිය ආශ්‍රයෙන් පහත ප්‍රකාශවල නෛතික වලංගුතාවය විමසන්න.

   (අ) අන්තර්ජාතික නීතියේ විෂයක් ලෙස, අන්තර්ජාතික සංවිධානයන්ට අදාලව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය විසින් අනුමිතව ප්‍රකාශයට පත් කෙරුණු නෛතික පුද්ගලභාවයක් ඇත. (ලකුණු 10)

(ආ) සාමාජික රටවල් අතර ගැටුම් නිරාකරණය කිරීමේ මාර්ගයක් ලෙසට එක්සත් ජාතීන්ගේ සංවිධානය රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලීන් පිළිගනී. (ලකුණු 10)

**(10 + 10 = ලකුණු 20)**

3. සොම්බියා රාජ්‍යයේ වැසියෙක් වන පායල් අසල්වැසි රටවල් වන බුංගා හා ලින්ලැංග් රාජ්‍යයන්ගේ සිට ලෝකයේ විවිධ සංවර්ධිත රටවල් වෙත පුද්ගලයන් සංක්‍රමණය කිරීමෙහි නියුක්ත වන්නෙකි. බුංගා සහ ලිංග්ලැංග් රාජ්‍යයන් අභ්‍යන්තර සන්නද්ධ ගැටුම්වලට මුහුණ දී සිටින අතර, බරපතල ආර්ථික අර්බුදයන්ට ද ලක්වී සිටිති. මෑතකදී, සංවර්ධිත රාජ්‍යයක් වන ෂයින් රාජ්‍යය, මිනිස් ජාවාරම මැඩලීම සඳහා දියත් කළ සිය ජාතික මෙහෙයුමේ දී බුංගා හා ලිංග්ලැංග් යන රටවල වැසියන් වූ කාන්තාවන් 27 දෙනෙක් තම භූමියේ දී බේරා ගත් බවට වාර්තා කළේය. මේ පිළිබඳ කළ විමර්ශනයේ දී අනාවරණය වූයේ සංක්‍රමණය සඳහා අවශ්‍ය ආරක්ෂිත, විධිමත්, නෛතික ක්‍රමවේදයකින් තොරව ඔවුන්ව පායල් විසින් සංක්‍රමණය කරවනු ලැබ ඇති බවටය. මෙම කාන්තාවන් 27 දෙනා පරිගණක විද්‍යා ක්ෂේත්‍රයේ උපාධිධාරීන් වන අතර, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා දෙන බවට පොරොන්දු වෙමින්, කප්පම් මුදල් ගෙන ඔවුන් රටින් පිට කොට ඇති බවට අනාවරණය විය. ෂයින් රාජ්‍යයට ඔවුන් ලඟා වූ පසුව, පායල්ගේ නියෝජිතයන් මෙම 27 දෙනාගේ ගමන් බලපත්‍ර බලහත්කාරයෙන් ලබා ගෙන ඇත. ප්‍රමාණවත් ආහාර හෝ නින්දක් නොමැතිව, පැය 18 ක් පුරාවට ලිංගික ශ්‍රමිකයන් ලෙස සේවය කිරීමට ඔවුන්ට බල කෙරුණි. මෙම පසුබිම තුළ, බලහත්කාරී ශ්‍රමය, ලිංගික වහල් සේවය හෝ වාණිජ ලිංගික සූරාකෑම සඳහා පුද්ගලයන් වෙළඳාම් කිරීම සිය රටේ නීතිය අනුව අපරාධ වරදක් බවට ප්‍රකාශ කළේය. මෙම අර්බුදය සඳහා විසඳුම් සෙවීමට තමුන්ට ආධාර කරන ලෙසට ෂයින් රාජ්‍යය සොම්බියා රාජ්‍යයෙන් ඉල්ලා සිටියේය. පායල් පුද්ගල ජාවාරමේ යෙදීම සම්බන්ධව තම රටේ ද අපරාධකරුවන්ගේ ලැයිස්තුවට ඇතුලු කරන ලද අයෙක් යයි පවසමින් සොම්බියා රාජ්‍යය ඊට ප්‍රතිචාර දැක්වීය.

ඉහත තත්වය සැලකිල්ලට ගනිමින්, ඒ ඒ රටට අදාළව මතුවන දේශභූමික පාත්‍රතාමය පදනම් (jurisdictional bases) හා ඊට අදාල වන නෛතික පදනම් කවරේදැ'යි සාකච්ඡා කරන්න. අදාළ නෛතික අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කළ යුතුය. **(ලකුණු 20)**

4. අන්තර්ජාතික නීතිය හා සම්මුතිමය බැඳීම් ගරු කරන රාජ්‍යයක් ලෙසට එක්සත් ජාතීන්ගේ සියලුම ප්‍රධාන අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් අපරානුමත කොට ඇත. ආර්ථික, සමාජ හා

සංස්කෘතික අයිතිවාසිකම් පිලිබඳ අනතර්ජාතික සම්මුතිය (ICESCR), සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR), කාන්තාවන්ට එරෙහි සියලු වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW), වධහිංසාව සහ වෙනත් කෲර, අමානුෂික හා අවමන්සහගත සැලකීම් හා දඬුවම්වලට එරෙහි සම්මුතිය (CAT), ළමා අයිතිවාසිකම් සම්මුතිය (CRC), සියලුම සංක්‍රමණික කම්කරුවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් පිලිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICMW), බලහත්කාරී අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂාව පිලිබඳ සම්මුතිය (CED) සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිලිබඳ සම්මුතිය (CRPD) මේ අතර වෙයි.

ඉහත දැක්වූ සම්මුතීන් අතරින් දෙකක් **(02)** තෝරාගෙන එකී සම්මුතීන් ශ්‍රී ලාංකීය නීති පද්ධතියට අවශෝෂණය කරගෙන තිබෙන්නේ කෙසේද සහ ශ්‍රී ලංකාව ඔබ තෝරාගත් සම්මුතීන් තුලින් මතුවන සම්මුතිමය බැඳීම්වලට ගරු කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට කොතරම් දුරට සමත් වී තිබේ ද යන්න විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

**(ලකුණු 20)**

5. ආලෝකා, භූලෝකා, දිව්‍යලෝකා හා විතාරා යනු 'නංගා' නම් වූ සමුද්‍රීය තීරයක් බෙදාගනු ලබන අසල්වැසි රාජ්‍යයන් සමූහයකි. මෙම රටවල් වසර අසූවක පමණ කාලයක් පුරාවට නංගා සමුද්‍රීය තීරය බෙදාගෙන පරිහරණය කිරීමේ නියුක්තව සිටියේය. මෙම භාවිතාවට අනුව, සෑම වර්ෂයකදීම, පාරම්පරික ධීවර කර්මාන්තයේ යෙදීම සඳහා එක් රටකට මාස තුන බැගින් හිමි වේ. මෙම කාල බෙදීම හා පාරම්පරික ධීවර කර්මාන්තය මත වූ සීමාව මේ කිසිදු රටක ධීවරයන් විසින් කිසි විටෙක උල්ලංඝණය කළේ නැත. 2020 වන තෙක්, රටවල් හතර සහ ඒවායේ ධීවරයන් අතර සහයෝගීතාවයෙන් කටයුතු කිරීමේ පුරුද්ද පැවැතුණි. 2020 වර්ෂයේ, සෑම වසරකම අවසන් මාස තුන ධීවර කටයුතු සඳහා වෙන් වූ විතාරා රාජ්‍යය දේශගුණ විපර්යාස නිසා මේ කාලයේ මුහුදු යාම ධීවරයන්ට අවාසි සහගත බව පවසමින්, සිය විරෝධතාවය පල කළේය. තම රට තුල ස්වභාවික සම්පත් හිග නිසා මුහුදු සම්පත් තම රට වෙනුවෙන් පමණක් වෙන් කල යුතු බවට විතාරා රාජ්‍යය ඉල්ලා සිටියේය. ගෝලීය වසංගතයෙන් පසුව මෙම රටවල් හතරටම මුහුණ දෙන්නට සිදු වූ ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස, මේ රටවල ධීවරයන්, ධීවර කර්මාන්තයේ නියුක්ත වීමේ දී රිසි ලෙස කටයුතු කරන්ට වූ අතර මේ නිසා ගැටුම් ඇති විය. එම ගැටුම් ප්‍රචණ්ඩ ක්‍රියා ද ඇතුලත් අපරාධ දක්වා ව්‍යාප්ත විය. මෙම තත්වය සලකා, ආලෝකා, භූලෝකා හා දිව්‍යලෝකා යන රටවල් අන්තර්ජාතික නීතියේ නෛතික ක්‍රියාවලිය යටතේ නංගා හි භාවිතය වෙන් කොට ගෙන,

පරිහරණය කිරීමට කැමැත්ත පල කලේය. කෙසේ වුවද, විතාරා රාජ්‍යය මෙම ක්‍රියාවලියට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කල අතර නංගා සමුද්‍රීය තීරය සමානව බෙදා ගැනීමට සිය විරෝධය ලිඛිතව ඉදිරිපත් කළේය. එම රට 2020 සිට තමුන් මෙම චාරිත්‍රයට එරෙහිව අඛණ්ඩ විරෝධතාකරුවෙක් (persistent objector) ලෙස කටයුතු කළ බවට පවසයි.

මෙම රාජ්‍යයන් හතරම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් බවට උපකල්පනය කරන්න.

(අ) ආලෝකා, භූලෝකා හා දිව්‍යලෝකා යන රාජ්‍යයන්ට නංගා සාමුද්‍රීය කඩ රටවල් හතරම අතර බෙදා ගැනීම සඳහා යෙදාගත හැකි අන්තර්ජාතික නීතිය තුළ අදාල වන රීති හා මූලධර්ම කවරේද යන්න පිලිබඳ උපදෙස් දෙන්න. **(ලකුණු 15)**

(ආ) ආරවුල් නිරාකරණය කිරීමේ අධිකරණ ක්‍රියාවලිය තුළ, නංගා සමාන ලෙස බෙදා වෙන් කිරීමට විතාරා රාජ්‍යයට සාර්ථක ලෙස විරුද්ධ විය හැකිද? **(ලකුණු 05)**

**(15 + 5 = ලකුණු 20)**

6. 1961 රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිලිබඳ වියනා සම්මුතිය රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා විනිර්මුක්තිය ස්ථාපිත කළ අතර, කොන්සල්වරුන් සම්බන්ධ නීතිය (එනම් පරිපාලන කටයුතු, යවන රාජ්‍යයට අදාළ වාණිජ කටයුතු ආරක්ෂා කිරීම, සහ වීසා නිකුත් කිරීම ආදියෙහි නියුක්ත තානාපති කාර්යාලයේ සේවකයන්) 1963 කොන්සල් සබඳතා පිලිබඳ වියනා සම්මුතිය මගින් ආවරණය කෙරෙයි.

(අ) ඉහත උද්ධෘතයේ පසුබිම තුල, රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ කොන්සල් නිලධාරීන් භුක්ති විඳින්නා වූ මුක්තියේ සමානතා හා අසමානතා විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ තුලනාත්මක විශ්ලේෂණය අදාල උදාහරණ මගින් සනාථ කල යුතුය. (ලකුණු 12)

(ආ) 'රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය, කෙසේ වුවද, අසීමිත නැත'. මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද? රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිලිබඳ වියනා සම්මුතිය සහ අදාල නෛතික අධිකාරීන් ආශ්‍රයෙන් උචිත උදාහරණ සමග විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

**(12 + 08 = ලකුණු 20)**

ප්‍රශ්න අංක **7** සහ **8** පහත දැක්වෙන කරුණු මත සාකච්ඡා කල යුතු වෙයි:

ඒ හා බී රාජ්‍යයන් යනු මුහුදුබඩ පිහිටි අසල්වැසි රටවල්ය. මෙම රටවල් දෙකම, 2022 දී ඇති කරගත්, 'ප්ලාස්ටික් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතියේ' කොටස්කරුවන්ය. බී රාජ්‍යය මෙම සම්මුතියේ කොටස්කරුවෙක් වූයේ, 'ගෝලීය ප්ලාස්ටික් දර්ශකයේ' 11 වන වගන්තිය තමුන්ට අදාල නොවන බවට වූ කොන්දේසිය මතය. කෙසේ වුවද, සම්මුතිය කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය තුල පෙන්වා දෙනු ලැබුවේ, ගෝලීය ප්ලාස්ටික් දර්ශකය සම්මුතියේ අරමුණු සාක්ෂාත් කරගැනීම මනින නිර්ණායකයක් බවය. අපරානුමත කළ සම්මුතිය බලාත්මක කිරීම සඳහා ඒ රාජ්‍යය විසින් ජාතික මට්ටමේ නීතියක් සම්මත කළ අතර මේ අනුව සිය දේශභූමිය තුල ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය පිටුදැකීම සඳහා මෙන්ම එක්වරක් භාවිතා වන ප්ලාස්ටික් නිෂ්පාදිත සීමා කිරීමේ නීතියක් ද ඇතුලත් වේ. කෙසේ වුවද, සම්මුතිය යටතේ ගෝලීය ප්ලාස්ටික් කළමනාකරණ දර්ශකය ප්‍රකාශයට පත් කරන ලද්දේ 2023 වර්ෂයේදීය. ඒ රාජ්‍යය තම රටේ වෙරලබඩ ප්‍රදේශවල සිදුවන ප්ලාස්ටික් නිසා ඇති වන පරිසර දූෂණය නිසා මෙම දර්ශකය තුල ලබාගත්තේ පහළ ස්ථානයකි. බී රාජ්‍යය කල ඉල්ලීම නිසා එම රටේ වාර්තාව දර්ශකය ගණනය කිරීමේ දී සලකා බැලුණේ නැත.

2024 වර්ෂයේ දී ජාතික පරිසර අධිකාරිය සහ ජාතික විද්‍යා පදනම එක්ව සිදුකල පර්යේෂණයක වාර්තාවක් නිකුත් වූ අතර ඒ අනුව පහත කරුණු හෙලිදරවු විය.

- ඒ රාජ්‍යයේ වෙරලබඩ ප්‍රදේශවල සියයට 87 ක් වූ ප්‍රමාණයක් ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිසා දූෂණය වී ඇත. මෙම ප්ලාස්ටික අපද්‍රව්‍ය සමුද්‍රීය දේශසීමාව ඔස්සේ ගමන් කොට තිබෙන බවට පර්යේෂණය තවදුරටත් අනාවරණය කරයි.
- වෙරලබඩ දේශසීමා විමර්ශනයේ දී තවදුරටත් අනාවරණය වූයේ ඒ රාජ්‍යයේ සමුද්‍රික කලාපය තුල දැකගන්නට ලැබුණු ප්ලාස්ටික් අපද්‍රව්‍යවල වැඩි පංගුවක් බී රාජ්‍යය විසින් සිය සමුද්‍රීය දේශසීමාව අසල බැහැර කරනු ලැබූ අපද්‍රව්‍ය බවයි.
- යට කී අධ්‍යයනය අනුව, ඒ රාජ්‍යය තුල පරිභෝජනය කෙරෙන මුහුදු ආහාරවල මයික්‍රෝ ප්ලාස්ටික් අන්තර්ගත වන අතර, පොදු ජනයාට සිදුවිය හැකි පොදු සෞඛ්‍ය අන්තරාය වලක්වනු පිණිස ඒවා වහාම බැහැර කල යුතු වෙයි. මෙබඳු මුහුදු ආහාර පරිභෝජනය කිරීමේ අවදානම වන්නේ, පෙනහලු පිළිකා, උපතේ දී සිදුවන විකෘතිතා හා පිළිකා ඇති වීමය.
- මුහුදු ආහාර යනු ඒ රාජ්‍යයේ ප්‍රධාන ආහාරය වන අතර, එම රටේ ජීවනෝපාය හා බැඳුණු සංස්කෘතියේ අංගයක් ද වෙයි.

ඒ හා බී යන රටවල් දෙකම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන්ය.

7. දෙන ලද සිදුවීමේ පසුබිම තුළ, 'ප්ලාස්ටික් පිටුදැකීමේ අන්තර්ජාතික සම්මුතිය' 1969 සම්මුති නීතිය පිලිබඳ වියනා සම්මුතිය යටතේ ඒ ඒ රාජ්‍යයන්ට බලපාන ආකාරය සාකච්ඡා කරන්න. ඔබගේ පිලිතුර නිසි උදාහරණ ආශ්‍රයෙන් සනාථ කල යුතුය. (ලකුණු 20)

8. යම් දෙන ලද සන්දර්භයක් තුල, ඒ රාජ්‍යය දේශසීමා හරහා සිදුවන පරිසර දූෂණය සම්බන්ධව අන්තර්ජාතික නීති රාමුව තුල බී රාජ්‍යයට එරෙහිව නඩු පැවරීමට අපේක්ෂා කරයි නම්, බී රාජ්‍යය මත වගකීම පැවැරීම සඳහා පවතින සම්භාවිතාවය සාකච්ඡා කරන්න. ඔබගේ පිලිතුර අදාල නඩු තීන්දු නීතිය ආශ්‍රයෙන් සනාථ කල යුතුය.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි